# අභ්‍යන්තර සටහන

පළාත් මහ රෝහල - බදුල්ල

| | |
|---|---|
| දිනය | 2022-08-13 |
| වෙත | සියළුම වාට්ටු හා රෝග ප්‍රතිකාර සිදු කරන විශේෂ ඒකකවල අංශ ප්‍රධානීන් වෙත |
| වෙතින් | අධ්‍යක්ෂ |
| පිටපත් | ප්‍රධාන විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරි, ලියාපදිංචි සහකාර වෛද්‍ය නිලධාරි, අදාළ විෂය භාර නිලධාරින් |
| විෂයය | වෛද්‍ය සහතික යැවීමේදී ලබා ගනු ලබන මුද්දර සහිත ලිපි කවර |
| ගොනු අංකය | BD/PGH/CPMA/1/2013 |

අංක 2292/13 හා 2022-08-09 දිනැති අති විශේෂ ගැසට්පත්‍රය මඟින් තැපැල් ව්‍යවස්ථාව සංශෝධනයට ලක් කර, 2022-08-15 දින සිට ක්‍රියාත්මක වන පරිදි තැපැල් ගාස්තු ඉහළ දමා ඇත. ඒ අනුව, තැපෑලෙන් යැවිය යුතු ලේඛන සඳහා පහත සඳහන් පරිදි වටිනාකමකින් යුතු මුද්දර ඇළවිය යුතු බව මෙයින් දැනුම් දෙමි.

- ✓ සාමාන්‍ය තැපෑලෙන් යවනු ලබන ලිපි සඳහා පළමු ග්‍රෑම් 30 සඳහා ලබාගත් රු:15.00 වෙනුවට රු:50.00 ක්ද ග්‍රෑම් 100 දක්වා වැඩිවන සෑම 20 ක් හෝ ඉන් කොටසකටම රු:10.00 බැගින් අය කරනු ලබයි.
- ✓ SL post courier නව සේවාවෙන් ලිපියක් යොමු කරන්නේනම්, පළමු ග්‍රෑම් 30 ට රු:150.00 කි.
- ✓ අමාත්‍යාංශ හා රජයේ දෙපාර්තමේන්තු සඳහා නව විශේෂ ලියාපදිංචි තැපැල් පහසුකම් සේවාවක් ක්‍රියාත්මකවන අතර, එහි ගාස්තු පළමු ග්‍රෑම් 20 ට රු:110.00 ක්ද, 20 ට වැඩිවන සෑම 10 කටම හෝ ඉන් කොටසකට උපරිම ග්‍රෑම් 100 දක්වා රු: 10.00 බැගින්ද, ග්‍රෑම් 100 සිට ග්‍රෑම් 1000 දක්වා ග්‍රෑම් 50 කට හෝ ඉන් කොටසකට රු: 20.00 බැගින්ද අය කරනු ලැබේ.
- ✓ ටෙලිමේල් පණිවිඩයක් යැවීම සඳහා පළමු වචන 10 ට රු:50.00 ක් වන අතර, වැඩිවන සෑම වචනයක් සඳහා රු:5.00 ක ගාස්තුවක්ද, ස්ථාවර ගාස්තු ලෙස රු:20ක්ද, පණිවිඩය බෙදීමේ සහතිකය ලබාගන්නේනම්, රු:30 ක්ද, යවන ලද මුල් පණිවිඩයේ සහතික කළ පිටපතක් සඳහා රු:100.00 ක්ද යන ලෙස මුද්දර ගාස්තු වටිනාකම් ඉහළ නංවා ඇත.

Dr. Upul Karunarathne
MBBS.MSc (Med.Admin). MD(Med.Admin) 13/8/22
Director
Provincial General Hospital
Badulla.